**තේ පර්යේෂණ මණ්ඩලය - 2023**

-------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තේ පර්යේෂණ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ , 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 48 හා 49 ඡේද ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනය තුළ වත්කම් හා වගකීම් හිලව් නොකළ යුතු අතර වත්කම් හා වගකීම් වෙන වෙනම වාර්තා කළ යුතු වුවද, කෙරීගෙන යන ව්‍යාපෘති වෙනුවෙන් මණ්ඩලයට ලැබියයුතු රු. 4,713,704 ක් ලැබියයුතු ශේෂයක් ලෙස ගිණුම්ගත නොකර ජංගම නොවන වගකීම් වලින් අඩුකර තිබුණු බැවින් මණ්ඩලයේ ජංගම වත්කම් හා ජංගම නොවන වගකීම් එම ප්‍රමාණයෙන් අවප්‍රමාණය වී තිබුණි. | මෙම ව්‍යාපෘතීන්ට අදාල ක්‍රියාකාරකම් අදාල කාලය තුළ නිම කිරීම සිදුකළ යුතු බැවින් ව්‍යාපෘතියට අදාල මුදල් ලැබෙන තෙක් එහි වියදම් දරා ඇති බැවින් හර ශේෂයන් වාර්තා වී ඇත. මූල්‍ය ප්‍රකාශන තුළ එකම ගිණුම් කාණ්ඩයකට අයත් ශේෂයන් එකට ඉදිරිපත් කිරීම පරිශීලනයට පහසු වන බැවින් බැර ශේෂ ගිණුම් සහ හර ශේෂ ගිණුම් සටහන් යටතේ ඉදිරිපත් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 8 හි 69 ඡේදය ප්‍රකාරව ශාන්ත කුම්බිස් වතුයායේ සේවකයන්ගේ 2014 සහ 2019 කාලපරිච්ඡේදයට අදාල දිරිදීමනා ගෙවීම වෙනුවෙන් රු.1,289,006 ක් වූ ප්‍රතිපාදන වෙන්කර තිබුණද සමාලෝචිත | 2024 ගිණුම් වර්ෂය තුළ සමාලෝචනයක් සිදු කර ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ප්‍රතිපාදන සමාලෝචනය කර ගිණුම්වල ගැලපීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂය අවසන් වන විටත් සමාලෝචනයක් සිදුකර ගිණුම් වලින් ගැලපීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 ප්‍රකාරව හුවමාරු නොවන ගණුදෙනුවක ප්‍රතිඵලයක් වශයෙන් ශුද්ධ වත්කම්වල වැඩිවීමක් අස්ථිත්ත්වයක් හඳුනාගන්නා විටදී එය අයභාරයක් ලෙස හඳුනාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී හඳුනාගන්නා ලද රු.34,475,431 ක ප්‍රදාන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ අයභාර ලෙස හඳුනාගෙන නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.429,910,000 ක මුදල අයභාර ආදායම් ලෙස ද, රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන වලින් පසුගිය වර්ෂයන් වල ලබාගත් ප්‍රාග්ධන වත්කම් සඳහා 2023 වර්ෂයට අදාළව හඳුනාගත් ආදායම වන රු. 86,527,960 ක් විලම්භිත ආදායම ලෙසද ගිණුම්ගත කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව අයභාරය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | මණ්ඩලය පිහිටි භූමියේ සහ වතුයායන්වල සිටුවා ඇති මහෝගනී, කොස් සහ යුකැලිප්ටස් යනාදී වටිනා උස් සෙවන ශාක 10,629 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 18 හි 13 හා 16 ඡේද ප්‍රකාරව පාරිභෝජ්‍ය ජෛව විද්‍යාත්මක වත්කම් ලෙස හඳුනාගෙන එහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | හඳුනාගෙන ඇති ගස්වල වටිනාකම තක්සේරු කිරීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව සමඟ මූලික කටයුතු සිදු කරමින් ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ජෛව විද්‍යාත්මක වත්කම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ යන්ත්‍ර හා උපකරණ වල ක්ෂය වටිනාකම රු.445,401 ක් අඩුවෙන් ගිණුගත කර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි. | ක්ෂය ගණනය කිරීමේ ගිණුම්කරණ දෝෂය 2024 ගිණුම් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව ක්ෂය ගණනය කර නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | තේ පර්යේෂණ මණ්ඩලයට හිමිකමක් නොමැති, ශ්‍රී ලංකා තේ මණ්ඩලය යටතේ ලියාපදිංචි වාහන 03 ක් රු.3,750,000 කට | අංක 32-1809 දරන වාහනය අළුත්වැඩියා කටයුතු අවසන් කර ලිපිලේඛන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට | මණ්ඩලයට අයිති වත්කම් පමණක් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රත්‍යාගණනය කර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණු බැවින් දේපළ පිරියත හා උපකරණ සහ ප්‍රත්‍යාගණන සංචිතය එම අගයෙන් අධිප්‍රමාණය වී තිබුණි. | භාර දී තිබූ අතර, අංක 90-6217 දරන වාහනය රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 ට අනුව අපහරණය කිරීමට කටයුතු සිදු කරමින් ඇත. 32-1806 අංක දරන වාහනය අලුත්වැඩියා කිරීම සඳහා එන්ජිමක් මිලදී ගැනීමට අයවැය ප්‍රතිපාදන නොමැතිකම නිසා වාහනය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත. | |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2012 සහ 2013 වර්ෂයන්හී කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට සහ තේ මණ්ඩලයට තේ විකුණුම් මත තේ පර්යේෂණ මණ්ඩලයට ලැබිය යුතු රු.494,194 ක් ශාන්ත කුම්බ්ස් වතුයායේ ණයගැතියන් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම මුදල අයකර ගැනීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි. | අයවිය යුතු මුදල් පිළිබඳ දන්වා මෙම ආයතනවලට ලිපි යොමු කිරීමට වතුයාය විසින් කටයුතු කර ඇත. | ක්‍රියාකාරී ආයතන තුනකින් මණ්ඩලයට ලැබිය යුතු මෙම දිගුකාලීන ණය අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශාන්ත කුම්බ්ස් වතුයායේ විවිධ තොග සැපයුම්කරුවන් වෙත වර්ෂ 02 සිට 10 දක්වා ගෙවිය යුතු එකතුව රු.1,931,878ක ණයහිමි ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට හෝ හිමිකම් නොපාන බව තහවුරු වන ණය හිමියන් සඳහා අවශ්‍ය ගැලපීම් කිරීමට හෝ මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි. | රු.137,632 ක මුදලක් ලිපිලේඛන පරීක්ෂාකර ගෙවීමට කටයුතු කරගෙන යන අතර රු.1,682,514ක ශේෂයක් ශාන්ත කුම්බ්ස් වතුයායේ මූල්‍ය අක්‍රමිකතාවයට අදාළ කටයුතු විසඳෙන තෙක් ආදායමට බැර කර නොගැනීමට විගණන හා කළමනාකරණ කමිටුවේදී නිර්දේශ කරන ලදි. ඉතිරි | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට හා හිමිකම් නොපාන බව තහවුරු වන ණය හිමියන් සඳහා අවශ්‍ය ගැලපීම් කිරීමට කඩිනමින් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | රු.111,730 ක මුදල සම්බන්ධයෙන් ලිපිලේඛන පරීක්ෂාකර ගෙවීමට කටයුතු කරනු ඇත. | |
| (ආ) | මණ්ඩලය විසින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ මහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු වසර 03 ක් ඉක්මවා තිබුණු පිළිවෙලින් රු.480,000 සහ රු.699,717 ක ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ගෙවීම් කර නොතිබුණි. | විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීමට පත්‍රිකාවක් ඉදිරිපත් කර 2024 වර්ෂය තුළ දී නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 ඡේදය | මණ්ඩලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2024 ජූලි 01 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | වාර්ෂික වාර්තා හැකි ඉක්මනින් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය. . | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික වාර්තා නියමිත දිනට පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |
| (ආ) | 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/ 2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | තාවකාලික හෝ අනියම් පදනම මත බඳවාගෙන තිබුණු දින 180 ඉක්මවූ සේවකයින් 93 කට 2014 ඔක්තෝබර් 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථිර පත්වීම් ලබාදී තිබුණද ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කල නිලධාරී කමිටුව වෙත යොමුකර අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමට කටයුතු සූදානම් කර ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත පත්වීම් ලබාදීමට හා ස්ථිර කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.12,739,502 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.77,885,774 ක් වී තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 65,146,272 ක පිරිහීමක්

නිරීක්ෂණය විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ශාන්ත ජෝකිම් හා ශාන්ත කුම්බ්ස් වතුයායන්හී ලාභය සියයට 65කින් අඩු වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් ඉකුත් වර්ෂය හා සැසඳීමේදි තේ විකුණුම් ආදායම සියයට 4 කින් ද , ස්ථාවර තැන්පතු පොලී අදායම සියයට 20 කින් ද , අමු දලු අලෙවි ආදායම සියයට 24 කින් ද, වැඩිවී තිබුණු අතර පිළිවෙලින් ගමන් වියදම් හා සැපයුම් සහ පරිභෝජන වියදම් සියයට 49 කින් සහ සියයට 28 කින් වැඩිවී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම හා ක්ෂණික වත්කම් අනුපාතයන් 4 : 1 ක් හා 3 : 1 ක් වූ අතර පසුගිය වර්ෂයේදීද එම අනුපාත 4 : 1 ක් හා 3 : 1 ක් වී තිබුණි. 2023 හා 2022 වර්ෂයන්හී තොගය හා කෙටිකාලීන ආයෝජන පිළිවෙලින් රු.241,363,431 ක් හා රු.219,821,063 ක් වීමෙන් මණ්ඩලයේ අධිකාරක ප්‍රාග්ධන තත්ත්වයක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ විශේෂ ව්‍යාපෘති යටතේ දේශගුණික විපර්යාස සඳහා තේ ශාකයේ අනුවර්තීය ප්‍රතිචාර අධ්‍යයනය කිරීම සඳහා 2017 නොවැම්බර් 24 දින රු.12,554,583 ක් වැය කර ඉන්දියාවෙන් මිලදීගත් උපකරණය, (Walk in Type Environmental Controlled Facility) අපේක්ෂිත පිරිවිතරයන්ට නොගැලපීම හා එහි ක්‍රියාකාරීත්වය අපේක්ෂිත මට්ටමින් නොපැවතීම මත වසර 5 ක් ගතවී තිබුණද පර්යේෂණ සඳහා භාවිතා කළ නොහැකිව නිෂ්කාර්යව පැවතුණු අතර එම ප්‍රසම්පාදනයට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් විධිමත් පියවරක් ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | යන්ත්‍රය ස්ථාපනය කිරීමෙන් පසු නියමිත කාර්යසාධනයට අනුකූල නොවන බව ශාක කායික විද්‍යා අංශයෙන් දැනුම් දී ඇති අතර අදාළ යන්ත්‍රය තේ පර්යේෂණ ආයතනයේ පිරිවිතරයන්ට අනුකූල නොවීම සහ සැපයුම්කරු විසින් ගිවිසුමේ කොන්දේසි කඩ කිරීමේ ගැටළුව සම්බන්ධයෙන් දේශීය හා විදේශ සැපයුම්කරුවන් යහපත් ප්‍රතිචාර නොදක්වා ඇති බැවින්, රු. 12,554,583 ක මුදල හා එකී මුදල ගෙවා නිමවන තුරු ඒ මත නෛතික පොළියක්ද ලබා ගැනීම සඳහා නඩු පැවරීමට කටයුතු කර ඇත. | වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග කඩිනම් කර අලාභ අයකර ගත යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පිළිවෙලින් ඉඩම් ප්‍රතිසංස්කරණ | වලහන්දූව වත්ත ඉඩම් | කඩිනමින් ඉඩම්වල බදු |

| | | | |
|---|---|---|---|
| | කොමිෂන් සභාවට, තලවකැලේ වැවිලි සමාගමට හා රජයට අයිති ඉඩම් වල මණ්ඩලය විසින් රු.73,933,378 ක් වැයකර වලහන්දූව,දෙණියාය සහ කොට්ටව ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිලි ඉදිකර මණ්ඩලයේ වත්කම් ලෙස ගිණුම්ගතකර තිබුණද එම ඉඩම් මණ්ඩලයේ නමට පවරා ගෙන නොතිබුණි. | ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යටතට ගෙන ඇති බැවින් හා මෙම වත්ත සම්බන්ධයෙන් රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් අභියාචනාධිකරණයේ ගොනුකර ඇති පෙත්සමේ නියෝගය ලැබෙන තෙක් තේ පර්යේෂණ ආයතනය විසින් භුක්ති විඳින හෙක්ටයාර් 01 කට වැඩි භූමි කොටසේ නීත්‍යානුකූල අයිතිය සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට නොහැකි වී ඇත.කොට්ටව උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානයේ ඉඩමේ ප්‍රමාණය අක්කර 50ට වඩා වැඩි බැවින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට ඉල්ලීම් ලිපියක් කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යංශය වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. දෙනියාය උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය සඳහා බදු ඔප්පුව ලබා ගැනීම සඳහා ස්වර්ණමය කොටස් හිමිකරුගේ අනුමැතිය ලබා ගැනීමට හා ජනාධිපති ලේකම්ගේ එකඟතාවය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් ඇත. | ඔප්පු හෝ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමටත් වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වූ, නැවත සේවයට නොපැමිණි සහ සේවයට පැමිණීමෙන් පසු අනිවාර්යය සේවාකාලය අවසන් වීමට පෙර සේවය අතහැර ගිය නිලධාරීන් 04 දෙනෙකු විසින් 2005 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා මණ්ඩලය සමඟ එළඹී තිබුණු ගිවිසුම් කඩකිරීම හේතුවෙන් අදාළ බැඳුම්කර වටිනාකම වූ රු.15,054,891 ක් 2023 වර්ෂය අවසානය වන විටත් ආපසු අයකර ගෙන නොතිබුණි. | බැඳුම්කර වටිනාකම වෙනුවෙන් ආයතනය විසින් නඩු පැවරීමට කටයුතු කර ඇත. | ගිවිසුම් කඩකිරීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 වර්ෂයේ සිට පැවත එන ශාන්ත කුම්බ්ස් වතුයායේ තේ අලෙවිසැලක් සඳහා පිරිසැකසුම් කරන ලද කන්ටේනර් ප්‍රදර්ශනාගාරයක් ස්ථාපිත කිරීමේ කාර්යය මේ දක්වා අවසන් කර නොතිබුණු අතර ඒ සඳහා වැය කර තිබුණු රු.760,604 ක මුදලක් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි. | තේ අලෙවිසැලක් නුවරඑළිය නගරයේ ආරම්භ කිරීම සඳහා අත්තිකාරම් මුදලක් පුද්ගලික ආයතනයට ගෙවා ඇත. ක්ෂේත්‍ර නිරීක්ෂණයක් සිදු කර අදාළ කන්ටේනර් බහාලුම පරිශ්‍රය තුළ දිරාපත්ව පවතින්නේද යන්න සොයා බැලීමටත් එම ආයතනයේ වගකිවයුතු අයකු සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකයක් දන්වන ලෙසටත් ලිපියක් මඟින් අමාත්‍යාංශයේ නීති නිළධාරී විසින් පර්යේෂණ ආයතනයට උපදෙස් ලබා දී ඇත. | කන්ටේනර් ප්‍රදර්ශනාගාරයේ වැඩ කඩිනමින් සම්පූර්ණකර ගැනීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග තුළින් මුදල් ආපසු ලබා ගැනීමට නොපමාව කටයුතුකර, වැඩ අවසන් වූ කාර්යයන් නිවැරදිව ගිණුම්වල ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා රාජ්‍ය සමාගමක් වෙත 2020 අප්‍රේල් 22 දින රු.4,228,700ක මුදලකට කොන්ත්‍රාත්තුව භාර දී 2020 අගෝස්තු 20 දින රු.1,141,749 ක අත්තිකාරම් මුදලක් එම ආයතනයට ගෙවා තිබුණි.සේවා සැපයුම්කරු විසින් ඉදිරිපත් කර තිබුණු ලංසු ලේඛන අනුව ඇණවුම් නිකුත් කළ දිනයේ සිට දින 120 තුළ වැඩ අවසන් කළ යුතු වුවද, 2024 ජුනි වනවිට වසර 4ක් ඉක්මවා ගියද එහි කටයුතු අවසන් කර නොතිබුණි. | සැපයුම්කාර ආයතනය විසින් කාර්යසාධන බැඳුම්කරය දින දීර්ඝ කරවාගෙන නිර්මාණ කටයුතු සිදු කරගෙන යනු ලබන අතර මේ වන විට මානව සම්පත් කළමනාකරණ, වැටුප් ලේඛන, භාණ්ඩ හා ගබඩා පාලන, මූල්‍ය හා ගිණුම්කරණ, නඩත්තු හා සේවා යන මොඩියුලයන්ගෙ නිපැයුම් කටයුතු අවසන් අදියරයේ කෙරෙමින් පවතී. | කළමනාකරණ තොරතුරු පද්ධතියෙහි කටයුතු කඩිනමින් සම්පූර්ණ කරගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තේ පර්යේෂණ මණ්ඩලයට අයත් තලවකැලේ ලැමලියර් වතුයායේ හෙක්ටයාර 1.367 ක භූමි ප්‍රමාණය, කර්මාන්තශාලාව හා සියලුම ගොඩනැගිලි 2003 | රාජ්‍ය ඉඩම් බැහැර කිරීමේ සීමාවන් පනවා ඇති බැවින් ඒ වෙනුවෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ගයන් පිළිබඳ අමාත්‍යාංශයේ උපදෙස් ලබා | මණ්ඩලයට අයත් දේපළ ඵලදායීව උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොපමාව ගත යුතුය. |

| | | |
|---|---|---|
| වර්ෂයේදී පෞද්ගලික සමාගමකට වසර 50 ක කාලපරිච්ඡේදයක් සඳහා බදු දී තිබුණද ගිවිසුම් ප්‍රකාරව බදු කුලී නොගෙවීම මත 2016 වර්ෂයේදී අදාළ දේපළ නැවත අත්පත් කරගෙන තිබුණු නමුත් අත්පත්කරගත් දින සිට 2024 ජූලි දක්වා එනම් වසර 08 ක් ඉකුත් වී ඇතත් එම වත්කම් ප්‍රයෝජනයට ගැනීමකින් තොරව නිශ්කාර්යව පැවතුණි. | ගැනීමට කටයුතු කර ඇති අතර ලැම්ලියර් වතුයාය ඇතුළු තේ පර්යේෂණ ආයතනයට අයත් වතුවල ඉඩම්, ගොඩනැගිලි හා අනෙකුත් වත්කම් භාවිතය හා නඩත්තුව සම්බන්ධයෙන් කමිටුවක් පත් කොට එහි නිරීක්ෂණ අනුව කටයුතු අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | |

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තේ පර්යේෂණ මණ්ඩලයේ කාර්ය මණ්ඩල අර්ථසාධක අරමුදල 1959 ජුනි 01 දින සිට අනුමත අර්ථසාධක අරමුදලක් බවට 2014 ඔක්තෝබර් 30 දින කම්කරු කොමසාරිස් විසින් සහතික කර තිබුණි. මෙම අර්ථසාධක අරමුදලේ කළමනාකරණ රීති සංග්‍රහයේ 4 (i) වගන්තිය ප්‍රකාරව අරමුදලේ භාරකාර මණ්ඩලය, තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා (භාරකාර මණ්ඩලයේ සභාපති), අරමුදලේ සභාපති විසින් අධ්‍යක්ෂවරු අතරින් නම් කළ සාමාජිකයින් දෙදෙනෙකු, අරමුදලේ සාමාජිකයින් අතරින් මහා සභාවේදී පත්කරනු ලබන සාමාජිකයින් දෙදෙනෙකු හා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නම් කළ අරමුදලේ සාමාජිකත්වය නොදරන තේ මණ්ඩලයේ නිලධාරින් දෙදෙනෙකුද ඇතුළුව සාමාජිකයන් හත් දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවද සභාපති විසින් තේ මණ්ඩලයේ | තේ පර්යේෂණ ආයතන කාර්ය මණ්ඩල අර්ථසාධක අරමුදලේ භාරකාර මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව පස් දෙනෙකු ලෙස සංශෝධනය කිරීමට 2022 වර්ෂයේ දෙසැම්බර් මස පැවති මහා සභා රැස්වීමේ දී සභා සම්මත කරගන්නා ලදි. ඊට අදාල සංශෝධන කටයුතු සිදු කිරීමට අදාළ ලිපිය කම්කරු කොමසාරිස් වෙත යොමු කර ඇති අතර අදාළ සංශෝධනයන් සඳහා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | අර්ථසාධක අරමුදලේ කළමනාකරණ රීති සංග්‍රහය ප්‍රකාරව භාරකාර මණ්ඩලය පත්කිරීමට හා සංශෝධනය කිරීමට කටයුතු කිරීම තුළින් තේ පර්යේෂණ මණ්ඩලයේ නිළධාරීන්ගේ අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සාමාජිකයින් දෙදෙනා 2024 ජූලි 01 දින විටත් භාරකාර මණ්ඩලයට පත්කර නොතිබුණි. | | |
| (ආ) | මණ්ඩලයට අයිති ශාන්ත කුම්බස් වතුයායේ 2017 සහ 2018 වර්ෂයන්හිදී සිදු වූ මූල්‍ය වංචාවන් හේතුවෙන් රු. 10,321,858 ක ශේෂයක් වර්ෂ 05 කට වැඩිකාලයක සිට ණයගැතියන් ලෙස පවතින නමුත් අදාළ පරීක්ෂණ කටයුතු අවසන් කර වගකිවයුතු පාර්ශවයන්ගෙන් එම මුදල් අයකර ගැනීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි. | නීතිපති දෙපාර්තමේන්තුව මගින් මෙම මූල්‍ය වංචාව සම්බන්ධයෙන් ඉදිරියේදී නඩු පැවරීමට කටයුතු යොදා ඇති බව ඒ පිළිබඳ කටයුතු කරන රජයේ අධිනීතිඥවරයා විසින් ආයතනය දැනුවත් කර ඇත. | මූල්‍ය වංචාව සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු නොපමාව අවසන්කර නඩු තීන්දු අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ අනුමත කාර්යය මණ්ඩලය තුළ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු 36 ක් පැවතියද සමාලෝචිත වර්ෂයේදී ඉන් තනතුරු 27 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු තනතුරු අතර අංශ ප්‍රධානී තනතුරු 03 ක්ද ප්‍රධාන පර්යේෂණ නිලධාරී තනතුරු 14 ක්ද ප්‍රධාන උපදේශන නිලධාරී තනතුරු 05 ක්ද ඇතුළු තනතුරු 22 ක් අභ්‍යන්තර උසස්වීම් මඟින් පිරවිය යුතු වුවද වර්ෂ 04 කට වැඩි කාලයක සිට මෙම තනතුරු පුරප්පාඩුව පැවතුණි. | අංශ ප්‍රධානී තනතුර අභ්‍යන්තර උසස් වීමක් වන අතර එම තනතුර සඳහා මේ වන විට අභ්‍යන්තර වශයෙන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරීන් නොමැති අතර අනෙකුත් තනතුරු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට මේ වන විට අමාත්‍යාංශ හරහා රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලියේ සමාලෝචන කමිටුවට ලිපියක් යොමු කර ඇති අතර එහි අනුමැතිය මත ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව ඇත. | පුරප්පාඩුව පවතින අනුමත කාර්යය මණ්ඩලයේ අත්‍යාවශ්‍ය තනතුරු සඳහා කඩිනමින් බඳවාගැනීම් කළ යුතු අතර මණ්ඩලයේ අවශ්‍යතාවය මත බඳවා ගැනීමේ පරිපාටියේ සංශෝධනයන්ද අනුමත කරවා ගත යුතුය. |
| (ආ) | මණ්ඩලයේ මෙහෙයුම් සහ උපදේශන නිලධාරී තනතුරුවලින් සියයට 62 ක්ද තාක්ෂණ හා තාක්ෂණික නොවන කළමනාකරණ සහකාර තනතුරුවලින් සියයට 53 ක්ද ප්‍රාථමික මට්ටමේ (පුහුණු) තනතුරු වලින් සියයට 57ක් ද | මෙම පුරපාඩුව පවතින තනතුරු අතරින් ගණකාධිකාරී සහ මෙහෙයුම් හා බලාත්මක ගණයේ තනතුරු 10 ක් සඳහා 2024 ජූනි සහ ජූලි මාසයන්හි පත්වීම් ලබා දී ඇති අතර ප්‍රසම්පාදන නිලධාරී තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කළමනාකරණ | අනුමත කාර්යය මණ්ඩලයේ අත්‍යාවශ්‍ය තනතුරු සඳහා පමණක් අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමෙන් පසුව කඩිනමින් බඳවාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රාථමික මට්ටමේ (නුපුහුණු) තනතුරු වලින් සියයට 54ක්ද පුරප්පාඩුව පැවතුණි.එමෙන්ම ජ්‍යෙෂ්ඨ අධ්‍යන හා පර්යේෂණ නිලධාරි තනතුරු 17 ක් හා අධ්‍යන හා පර්යේෂණ නිලධාරි තනතුරු 27 ක් පැවතියද සමාලෝචිත වර්ෂය අවසානය වන විට පිළිවෙලින් ඉන් තනතුරු 5ක් හා 15ක් පුරප්පාඩුව පැවතුණි. | සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගැනීමට ලිපියක් යොමු කර ඇත. කළමනාකරණ සහකාර - තාක්ෂණ නොවන තනතුරු වල පවතින පුරප්පාඩු පිරවීම සඳහා බඳවා ගැනීමේ තරග විභාග පවත්වා ඇති අතර, සම්මුඛ පරීක්ෂණ පවත්වා මණ්ඩලයේ හා අමාත්‍යාංශයේ අනුමැතිය මත පත්වීම් ලබා දීමට නියමිතව ඇත. රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලියේ සමාලෝචන කමිටුව මගින් ප්‍රාථමික සේවා ගණයේ තනතුරු සඳහා ශ්‍රම බලකාය මගින් තනතුරු 05ක් පිරවීමට අනුමැතිය ලබා දී ඇති අතර, අවශ්‍ය සාධාරණීකරණයන් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. අනෙකුත් තනතුරු පුරප්පාඩු සඳහා අමාත්‍යාංශ හරහා රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලියේ සමාලෝචන කමිටුවට ලිපියක් යොමු කර ඇත. | |
| (ඇ) | මානව සම්පත් කළමනාකරණය සඳහා නීති රීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පරිපාටි අත්පොතක් සකස්කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේදීද අවසන් කර නොතිබුණි. | යාවත්කාලීන කරන ලද තේ පර්යේෂණ ආයතනයේ කාර්යාල ක්‍රියා පරිපාටි අත්පොතෙහි කෙටුම්පත සමාලෝචනය කරගැනීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව වෙත ලිපියක් සමග යොමු කර ඇත. | මානව සම්පත් කළමනාකරණය සඳහා නීති රීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පරිපාටි අත්පොත සකස් කිරීම කාර්යක්ෂමව අවසන්කර නිසි අනුමැතීන් මත අවශ්‍ය කටයුතු කළ යුතුය. |